## ඔවුන්ගේ සැන්දෑව විඳින්න දෙන්න

විශ්‍රාමිකයෙක් කිව්වම අපට හිතට එන්නෙ ජීවිත කාලයම රැකියාවක් වෙනුවෙන් තමන්ගේ ශ්‍රමය වැය කරලා ජීවිතයේ අවසන් කාලයේ තැපැල් කන්තෝරුව ළඟ පෝලිමේ ඉඳලා තමන්ගෙ වැටුප ගන්න වයසක පිරිමියෙක් හෝ කාන්තාවක්. මේ අසරණ මිනිසුන්ව මංකොල්ලකන්න කෙනෙක් හිතනවා නම් ඒක සහ ගහන අපරාධයක්. මොන හේතුවකටද මන්දා අපේ රටේ නම් වයසක මිනිසුන්ගෙ විශ්‍රාම වැටුප මංකොල්ලකෑම් ගැන අහන්න ලැබෙන්නෙ නම් ඉතාමත්ම අඩුවෙන්. මං හිතන්නෙ අපේ ආසියාතික සමාජය වැඩිහිටියන්ට සැළකීම ගැන තාමත් ඉහළින්ම හිතන නිසා වෙන්න ඇති. (ඒත් විශ්‍රාම වැටුප ගෙදර අරගෙන ගියාම ඒක ඩැහැගන්න බලාගෙන දුවල පුතාල ලේලිලා බෑනලා ඉන්න එක නම් වෙනම කතාවක්)

දැන් දැන් වික්ටෝරියාවේ සීනියර් සිටිසන්ස්ලට පහරදී මංකොල්ල කෑම් වැඩි වෙලා තියෙන බව තමයි වාර්තා වෙන්නේ. මේක හරිම ඛේදවාචකයක්. අපේ රටවල වගේ නෙවෙයි මෙහේ මිනිස්සු ජීවත් වෙන්නෙ ස්වාධීනව. හුදකලාව. මුදල් යහමින් ඇති මිනිස්සු වැඩිහිටි නිවාස වල හිටියත් බහුතරය ඉන්නෙ කුලී නිවාස වල. අනෙක මේ මිනිසුන්ට නෑදෑයොත් අඩුයි. ඉන්න අයත් තම තමන්ගෙ වැඩක් පලක් බලාගෙන දුරට වෙලා ඉන්නවා ඇරෙන්න මේ වයසක අය ගැන සොයා බැලීමකුත් නැහැ. ඉතින් මේ අයට තියෙන එකම සහනය තමයි ජීවිත කාලයම අවංකව වැඩ කරලා හිමිකම් ලැබූ විශ්‍රාම වැටුප. ඒක නැති උනොත් බිල් ගෙවන්න ගෙවල් කුලී ගෙවන්න කන්න බොන්න ඉන්ධන වලට ගෙවන්න මුදලක් කොයින්ද? සේරම ඉවරයි.

ඉතින් එහෙම ඉන්න මේ වයසක මිනිසුන්ට පහර දීලා මංකොල්ලකනවා කියන්නෙ සහගහන අපරාධයක්. මේවා නවත්වන්න පොලිසිය මෙයට වඩා උනන්දු විය යුතුයි කියලයි චූටි මල්ලිට නං හිතෙන්නේ.

මේ සටහන ලියවුණේ අපේ ගෞරවණීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් වන ශ්‍යාමන් ජයසිංහ බොස්ට පහර දීලා එතුමාගෙ මුදල් පසුම්බිය උදුරාගෙන ගිහින්ය කියලා මූණු පොතේ



දැක්ක ආවේගයටයි. මේක මාර කෙලියක්. මේ වයසක මනුස්සයාට පහර දීලා කකුලත් ඩැමේජ් කරලා ගිහින් තියෙන්නෙ තරුණ සුදු කොල්ලො දෙන්නෙක්. අම්මපා මට ඔහොම එකෙක් අහුවුණොත් කොල නැති ගහේ යන්න වුනත් ඇට මුං ඇට කරනවාමයි.

## ක්‍රිකට්

ලංකාවේ මිනිසුන්ව එක කොඩියක් යටතට ගේන්න පුලුවන් වෙන්නේ කාරණා දෙකක් නිසා. එක්ක දේශප්‍රේමය. අනෙක ක්‍රිකට්.

අපේ රටේ ක්‍රිකට් ලෝලීත්වය කියන්නෙ උන්මාදයක්. මේ උන්මාදය නිසාම මේ දවස් වල ජාතික කොඩියටත් ලොකු ඉල්ලුමක් තියෙනවා. මේ ක්‍රිකට් ලෝලීන්ගෙන් අහන්නකො මැච් ගැන. සංගා ගැන. ඩිල්ෂාන් මහේල ගැන. මැච් වල ස්කෝර් එක විතරක් නෙවෙයි



ක්‍රීඩකයන්ගෙ පවුල්වල පැටිකිරිය ඉඳලා කියයි කිසි අඩුවක් නැතුව. ඒ ගමන්ම නිකමට අහන්නකෝ ඔය උඩදාගෙන වනන ඇගේ ඔතාගෙන ඉන්න ජාතික කොඩියේ වර්ණ වලින් සංකේතවත් වන්නෙ මොනවද කියලා. ගොඩ දෙනෙකුට යන්න වෙන්නෙ පොළොව පලාගෙන.

(අතුරු කතාවක් - ලංකාවෙ ජාතික කොඩියෙ අර්ථ දැක්වීම් වලට චූටි මල්ල කිසිසේත්ම එකඟ නැහැ. අපේ ජාතික කොඩිය කරන්නෙ ජාතීන් එකමුතු කිරීම නෙවෙයි. පාට පාට තීරු තීරු වලට ජාතීන් බෙදා වෙන්කරන එක. අම්මපා මං ජනාධිපති වුනානම් මුලින්ම කරන කාරියක් තමයි මේ ජාතිවාදී ජාතික කොඩිය වෙනුවට සියලුම ජාතීන්ට සමතැන දෙන ජාතික කොඩියක් නිර්මාණය කරන එක)

ඕක තමයි ලොක්කා තත්වය. මේක මොඩනයිස් වෙච්ච ලෝකයක්. මිනිස්සුන්ට බැනලා වැඩක් නැහැ. ලංකාවට ජාතික ක්‍රීඩාවක් කියලා එකක් තියෙනවා. ඒත් ඒ ජාතික ක්‍රීඩාව ගැන මිනිස්සු නොදන්නේ ක්‍රීඩා අමාත්‍යංශයයි ඒක අයිති රජයයි ඒක ප්‍රවර්ධනය නොකරණ නිසයි. කොහොම හරි ජාතික ක්‍රීඩාව නග්ගලා ගත්තත් මේ වගේ ස්කෝර් කරන්න හම්බවෙන එකක් නැහැ ඉන්ටනැෂනල්.

මට නම් මේ ක්‍රිකට් වල තියෙන වැදගත්ම දේ දවසකට හරි කට්ටිය ජාති බේද ආගම් කුල බේද නැතිව එකම පැත්තට වියර් එක දාන එකයි. මාර ලස්සන දර්ශනයක් ඒක.

කොහොම උණත් දැන් ඉදිරියට ගිය දේ ආපහු අඳින්න බෑ. කොහොමද ලොක්කා පහුගිය ගේම් ටික. එලම තමයි. ඇෆ්ගන් ගේම මාරයි නේද. ඇඟ රත් වෙලා ගියා නේද? බැටින් කෙසේ වෙතත් මෙච්චර කල් ගිහිල්ලා වෙඩි වගේ බෝලර්ස්ලා දෙතුන් දෙනෙක් ගොඩ දාගන්න බැරි වුණේ මොකද? මාලිංගයි කුලෙයි දැං වර්ල්ඩ් කප් කීයක් කළාද? රටේ වෙන බෝලර්ස්ලා නැද්ද තරුණ වයසේ? රංගනටත් දැං කීයද? අනිත් එක යකෝ අඩි පහට වඩා උස එවුන් අපේ රටේ ක්‍රිකට් ගහන්නෙම නැද්ද? ජයසූරිය ලොක්කා දැං තේරීම් කමිටුවේ ප්‍රධානියා වෙලා කොච්චර කල්ද? මේක නං මාර වැඩක් තමයි. ඩිලාන් සංගා මහේල ගියාට පස්සේ අපි ක්‍රිකට් ගහන්නැද්ද?

ඇත්තම කියනවා නම් පහුගිය ගේම් ටික හොඳයි. ඒත් නොකවුට් රවුන්ඩ් එක ගැන නං මට නෝ හෝප්.

## හේමන්තයක් සේ සොඳුරු මිනිසෙක්

හේමන්ත ඩයස් කියන ප්‍රමාණයෙන් කුඩා වුණත් අති දක්ෂ ගායන ශිල්පියාගේ ගී අහන්න මං ප්‍රිය කළේ මෙපුර ගී තිබුණ කාලේ ඉඳලා. පසුගිය දා පැවැත්වුණ වැඩේට මං සෙට් වුණේ ටිකක් පරක්කු වෙලා. වැඩේ නැගලා ගියා. නැටුම් ටිකත් ගින්දර වගේ. නියමෙට මැච් වෙලා ගියා. මිනිස්සු දැන් පුරුදු වෙලා තියෙන්නේ ඕනෙම දේක වටිනාකම මුදලින් මනින්න. හැබැයි එහෙම නොවන මිනිස්සුත් ඉන්නවා ටිකක් හරි. එහෙම මිනිස්සුන්ට තියෙන්නේ උදාර අදහස්. ඒව මුදලට තක්සේරු කරන්න බැහැ. දැං සාමාන්‍ය ලෝකෙ වගේම කලා ලෝකේ මහා පරිමාණයෙන් වෙනස් වෙලා. පොතක කතෘ භාගයවත් හරියට ලේඛකයාට ලැබෙන්නෙ නැහැ. මුල් ගායකයාට සත පහක් වත් නොදී ඔවුන්ගේ පැරණි ජනප්‍රිය ගීත රින්ගින් ටෝන් වලට විකුණලා ලක්ෂ ගණනින් මුදල් උපයන කලාකාරයන් ඉන්න සමාජයක්. අයිතිය යුතුකම සමාජ සාධාරණය කියන එක බහුතරයකට අමතක



වෙලා තියෙන යුගයක තමන් අපි කියපු හොඳ මිනිස්සු අතර ඉන්න කෙනෙක් බව හේමන්ත නිහඬව ඔප්පු කළා. හේමන්ත අයියාට චූටි මල්ලි සළකන්නෙ සයිස් එකට පෙනුමට නෙවෙයි. අරමුණු වලට. ඔබට ජයම වෙන්න කියා පතනවා. ඔහොම යං..

## හොඳ වැඩ

පහුගිය දවසක අපේ මිත්‍රයකුගේ දැනුම් දීමකින් පස්සෙ ගියා ෆුඩ් ගෙයා එකකට. තිබුණේ මෙන්සීස් හෝල් එකේ ඩැන්ඩිනොන් වල. අනුරාධපුරේ පැත්තේ දුෂ්කර පාසලකට උපකරණ වගයක් අරන් දෙන්න තමයි මේ වැඩේ සංවිධානය කරලා තිබුණේ. ඒක උතුම් වැඩක්. මොන අඩුපාඩු තිබුණත් අපේ මිනිසුන් යහපත් දෙයට උපකාර පෙළඹෙන්නේ ඉවෙන් වගේ.

උදව් කරන්න තොරාගෙන තිබුණ පාසලේ පින්තූර දැක්කම වැඩේ වටිනා කම තවත් වැඩියෙන් දැනුණා. මහා පිරිවැයක් දරලා



ලොකු ෂෝ එකක් කරලා මුදල් ටිකක් යවනවට වඩා ශ්‍රමය වැය කරලා සාමූහික වැඩක් කරලා වැඩි මුදලක් යවන එක වඩා වැදගත් කියලා මොනවට ඔප්පු වෙනවා මේ වගේ වැඩ වලදී. වැඩේ ලස්සනයි. හොඳයි. හැබැයි ටේක් අවේ තිබුණානම් හොඳයි කියලා හිතුණා. මොකද හුඟ දෙනෙක් ඇවිත් හිටියා කෑම අරගෙන යන්න. මොකක් හරි ප්‍රශ්නයක් තියෙන්න ඇති. කමක් නැහැ. ඔබ සැම කළ දේ වැදගත්. මේ වගේ වැඩ ඉදිරියටත් කරන්න ශක්ති ධෛර්යය වැඩි වැඩියෙන් ලැබෙන්න කියලා චූටි මල්ලි බොක්කෙන්ම සුබ පතනවා.

# දහඅට වරිගුව

## තාමත් අං

මේ ලෝකේ මිනිස්සු කෝටිධාශයක් ඉන්නවා ඇහැට පේන සත්‍යය පිළිගන්නවාට වඩා තමන් විශ්වාස කරගෙන ඉන්න මිථ්‍යාවේම ඇලිලා ගැලිලා ඉන්න කැමති. උගත් කමින් අඩු සමාජයක නම් ඒ ලක්ෂණය සාමාන්‍ය දෙයක් හැටියට දකින්න තිබුණා. ඒත් ඕස්ට්‍රේලියාව වගේ රටක වාසය කරන උගත් කමින් වැඩි මිනිස්සුත් මේ වගේ බූල් කෙළිනකොට මොන පැත්තෙන් හිනා වෙන්නද කියලා චූටි මල්ලිට හිතාගන්න බැහැ.

මිනිස්සු ලක්ෂ හැට දෙකක් ඡන්දය දීලා දූෂිත පාලකයෙක් ගෙදර යැව්වෙ පිස්සුවට නෙවෙයි. ඒ දූෂිතයා රට විනාශ කරමින් සිටිය නිසා. මත් කුඩු මත් ද්‍රව්‍ය ගෙන්වන්නන්, බෙදා හරින්නන්, මිනී මරුවන්, මංකොල්ලකාරයන්, කප්පම්කාරයන්, හොරුන්, තක්කඩියන් ආරක්ෂා කරමින් උන්ගෙන් යැපෙමින් පරම්පරා ගණනාවකට ඇති තරම් වස්තු කන්දරාවක් හොරකම් කළ, තමන් අකමැති අයගෙන් පන්න පන්නා පළිගත්ත, මරාදමාපු, අඩුකඩපු, අතුරුදන් කරවපු පාලකයෙක් වෙනුවෙන් තවමත් අඬන මේ මිනිස්සු දැක්කම පුදුම හිතෙනවා.



තමන්ගෙ පවුලේ පිස්සු විකාර සඳහා කෝටි ගණන් මහජන මුදල් විනාශ කළා මදිවට අපේ දන්නා ඉතිහාසයේ තිබ්බ දූෂිතම ජනාධිපතිවරණයත් තිබ්බෙ මේ පාලකයාම තමයි. ප්‍රකෝටි ගණන් මහජන මුදල් වීසි කරලාත් ජාතිවාදය අවුස්සලාත් ඔහුට ජය ගත නොහැකි වුණේ ජනතාව බුද්ධියට ඉඩ දුන්න නිසා. සාධාරණ ජනාධිපතිවරණයක් තිබ්බා නම් ඔහු පරදින්නේ මෙයිටත් වඩා කුජීත විදිහට.

ඒ දූෂිත පරාජිතයාට නිදහසේ විශ්‍රාම සුවය විඳින්න ඉඩ නොදී නැවතත් හුලං ගහලා පුම්බලා ගන්න දඟලන අය එහෙම කරන්නෙ රට ගැන ආදරයෙන් නෙවෙයි. තම තමන්ගෙ පුද්ගලික සුබ සිද්ධිය වෙනුවෙනුයි. තමන් මෙතුවක් කාලයක් මේ දූෂිත පාලකයාට මුවා වෙලා කරපු ගසා කෑම් තස දුරටත් ඉදිරියට කරගෙන යන්න තමයි මේ අයට අවශ්‍ය.

මෙල්බන් නගරයේ දේශපාලන පක්ෂයක් පරාජිත දූෂිතයා නැවත කරළියට ගේන්න පෙත්සම් අත්සන් කරන්න පටන් අරන් තියෙන්නෙත් ඒ නිසාම තමයි. ඒ දූෂිත මිනීමරු මිත්‍යාදෘෂ්ටික පාලකයාට මුවා වෙලා කාපු කෑමේ රස තාමත් මේ අයට අමතක කරන්න බැහැ. ඒ රස තවත් වටයකින් විඳින්න මගක් පාදා ගන්න දඟලන මේ දඟලිල්ල දකිනකොට චූටි මල්ලිට ඇතිවෙන්නෙ ඔක්කාරයක්.

**චූටි මල්ලි**